# තාක්ෂණවේදය සඳහා විද්‍යාව

## විෂය නිර්දේශය

(සංශෝධිත ගණිතය සංරචකය)

## අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ)

## 12 හා 13 ශ්‍රේණි

(2013 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)

තාක්ෂණ අධ්‍යාපන දෙපාර්තමේන්තුව
විද්‍යා හා තාක්ෂණ පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම

ශ්‍රී ලංකාව

www.nie.lk

**උසස් පෙළ තාක්ෂණවේදය විෂය ධාරාව**

**12 සහ 13 ශ්‍රේණි**
**විෂය නිර්දේශ**

**ප්‍රථම මුද්‍රණය - 2014**

© ජාතික අධ්‍යාපන ආයතනය

මුද්‍රණය: මුද්‍රණාලය
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම

වෙබ් පිටුව - www.nie.lk
දුරකථනය - 011-7601601

## ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ පණිවුඩය

''මහින්ද චින්තන'' ඉදිරි දැක්ම අනුව පිළියෙල කර ඇති ශ්‍රී ලාංකීය අනාගත සංවර්ධන සැලසුම් පදනම් වී ඇත්තේ නාවික, ගුවන්, ආර්ථික, වාණිජ හා අධ්‍යාපන යන පංච කේන්ද්‍රීය සංවර්ධන උපාය මාර්ගයන් මුල් කොටගෙන ය. මෙම සංවර්ධන කාර්යයන් සඳහා තාක්ෂණික නිපුණතාවන්ගෙන් සමන්විත මානව සම්පත් සංවර්ධනය කිරීම සඳහා විශාල ඉල්ලුමක් වර්තමානයේ නිර්මාණය වී තිබේ. එසේ වුව ද වර්තමානයේ දී ක්‍රියාත්මක වන අධ්‍යාපනය තුළ උසස් පෙළ සිසුනට ඉගෙනුම ලබා ගැනීමට අවස්ථාව ඇත්තේ විද්‍යා, ගණිත, වාණිජ හා කලා විෂය ධාරාවන් වන අතර එයින් ද වැඩිම සිසුන් ප්‍රමාණයක් ඉගෙනුම ලබන්නේ කලා විෂය ධාරාවේ ය. වාර්ෂික ව විශ්ව විද්‍යාල පද්ධතිය තුළින් නිර්මාණය කරන්නේ ද වැඩි වශයෙන් ම වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ දක්ෂතාවන් හා කුසලතාවන්ගෙන් සමන්විත නොවන්නා වූ විශාල කලා උපාධිධාරීන් ප්‍රමාණයකි. මෙය කලා උපාධිධාරීන් අතර විශාල සේවා වියුක්තියක් ඇති වීමට ද මූලික ව බලපා තිබේ.

මෙම තත්වය වහාවෙනස් වි යුතු බව රජය විසින් හඳුනාගෙන ඇති අතර තරුණ තරුණියන් නව අභියෝවලට මුහුණ දීමට හා රැකියාවල නියුතු වීමට අවශ්‍ය වන්නා වූ දක්ෂතාවන්ගෙන් යුක්ත රැකියා වියුක්තිය අඩු කිරීමට ඉවහල් වන තාක්ෂණික හා මෘදු කුසලතාවලින් සමන්විත වීමේ අවශ්‍යතාව ද මනාව අවබෝධ කොටගෙන ඇත. අලුතින් හඳුන්වා දෙනු ලබන තාක්ෂණික විෂය ධාරාව මාර්ගයෙන් ජාතියෙහි දරුවනට රැකියාවක් සඳහා අවශ්‍ය වන්නා වූ දැනුම, අවබෝධය හා දක්ෂතාවන් විශ්වවිද්‍යාල අධ්‍යාපනය හරහා නිර්මාණය වන අතර විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා අවස්ථාව නොලබන සිසුනට ද ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) පද්ධතියට ප්‍රවේශ වීමට හැකි වනු ඇත.

මෙම ජාතික කාර්යය ඉටු කිරීමේ දී මහත් වෙහෙසක් දැරූ අදාළ අමාත්‍යාංශවලට ද, ආයතනවලට ද, දෙපාර්තමේන්තුවලට ද, විශ්ව විද්‍යාලවලට ද ඉතා කෙටි කාලයක් තුළ අදාළ විෂය නිර්දේශයන් සම්පාදනය කිරීම සඳහා දායක වූ සිලුම දෙනාට ද ඔවුන්ගේ කැපවීම වෙනුවෙන් මාගේ ස්තුතිය පළ කිරීමට ද මෙය අවස්ථාවක් කරගනු කැමැත්තෙමි.

**බන්දුල ගුණවර්ධන**
අධ්‍යාපන ඇමති
අධ්‍යාපන අමාත්‍යාංශය
ඉසුරුපාය
බත්තරමුල්ල.

## ගරු උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගේ පණිවුඩය

අධ්‍යාපන අමාත්‍යාංශය, යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය එක්ව හඳුන්වා දෙන නව "තාක්ෂණවේදය" විෂය ධාරාව අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් අද දින හඳුන්වා දීමට ලැබීම ශ්‍රී ලාංකික අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඓතිහාසික සිදුවීමකි.

රටට අවශ්‍ය තාක්ෂණය පිළිබඳ උගතුන්, බුද්ධිමතුන් හා ප්‍රවීණයන් මෙන් ම පර්යේෂකයන් ද මෙම නව විෂය ධාරාව ඔස්සේ බිහිවනු දැකීම අපගේ අපේක්ෂාවයි. අ.පො.ස. උසස් පෙළින් පසු කොටසක් තාක්ෂණ ශිල්පීන් ලෙස රැකියා වෙළෙඳපොළට එක්වන අතර, තාක්ෂණවේදය පිළිබඳ විද්‍යාවේදී උපාධිය හදාරා අප විශ්වවිද්‍යාල පද්ධතිය තුළින් තවත් බුද්ධිමතුන් පිරිසක් රැකියා වෙළෙඳපොළේ අවශ්‍යතා සඳහා කළමනාකරුවන්, විශේෂඥයන්, ගුරුවරුන් හා ආචාර්ය මහාචාර්යවරුන් ලෙස එක් වී අප ශ්‍රී ලංකාවේ දිගුකාලීන දැක්ම වන ආසියාවේ ආශ්චර්යය බවට ශ්‍රී ලංකාව පත් කිරීමට ඔවුන් දායක වනු දැකීම අපගේ අපේක්ෂාවයි.

ඒ සඳහා පාඨමාලා 40 ක් පමණ විශ්වවිද්‍යාල සියල්ල තුළ ම සූදානම් වන අතර 2016 සිට ඔවුන් ශ්‍රී ලංකා රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතියට පිළිගැනීමට අප සියුල දෙනා සූදානම් ව සිටින බව ද දන්වන්නේ ඉමහත් සතුටිනි.

මෙම නව තාක්ෂණ විෂය ධාරාව අතිශය සාර්ථක විෂය ධාරාවක් වන බව අපගේ ඒකාන්ත විශ්වාසය යි.

**එස්.බී. දිසානායක**
උසස් අධ්‍යාපන ඇමති

## ගරු යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමාගේ පණිවුඩය

කාර්මික අධ්‍යාපනය සහ වෘත්තීය පුහුණු විෂය ක්ෂේත්‍රය පවතින මට්ටමින් ඉහළ නැංවීමට අදාළ ප්‍රතිපත්තිමය තීරණ ගණනාවක් ම කලින් කලට පසුගිය රජයන් විසින් ගෙන තිබුණත් එය ඉලක්කගත අරමුණු කරා ළඟා නොවූ බව තර්කයකින් තොර ව පිළිගත යුතු ය.

මහින්ද චින්තන ඉදිරි දැක්මෙහි තැබූ පොරොන්දු ප්‍රකාවර ම යමින් මෙම තත්වයට හේතු සෙවූ අපට මීට අදාළ තීරණාත්මක සාධකය ප්‍රත්‍යක්ෂ විය. එනම් සංවර්ධිත බොහෝ යුරෝපා හා ආසියානු රටවල කාර්මික අධ්‍යාපනය හා වෘත්තීය පුහුණුවට අදාළ තාක්ෂණ විෂය ධාරාව විශ්වවිද්‍යාල අධ්‍යාපනයට සමගාමී විෂය ක්ෂේත්‍රයන් ලෙස වර්ධනය වීමට මහෝපකාරී වී ඇති සාධකය නම් තාක්ෂණ විෂය ධාරාව එම රටවල පාසල් විෂයමාලාවන් සමඟ සාර්ථක ලෙස සුසංයෝගීව තිබීමයි.

ලෝකයේ පළමු වරට යෞවන කටයුතු විෂය නිපුණතා සංවර්ධනය සමඟ ඒකාබද්ධ කොට අමාත්‍යංශයක් ගොඩනැගූ රට ශ්‍රී ලංකාවයි. අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා මීට වසර 03 කට පෙර එම ප්‍රගතිශීලී පියවර තබන්නේ නූතන සංවර්ධිත ශ්‍රී ලංකාව ගොඩනැගීමේ එක් මූලික පියවරක් වශයෙනි. එසේ නම් තාක්ෂණ විෂය ධාරාව ශ්‍රී ලංකාවේ පාසල් අධ්‍යාපනයේ උසස් පෙළ විෂයමාලාව සමග ඒකාබද්ධ කිරීමත් සමග ම යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය ගොඩනැගීමේ දි තැබූ ආරම්භක අරමුණු අභිමතාර්ථ හා බලාපොරොත්තු සියල්ල මල්ඵල දැරීමට තිබූ අවසන් බාධාව ද පහව ගිය බව මාගේ එකම විශ්වාසයයි. එනම් මෙතැන් සිට තාක්ෂණ විෂය ධාරාව ඔස්සේ නිපුණතා සංවර්ධනයට පිවිසෙන තරුණයා හෝ තරුණිය ඊට අදාළ දැනුම, කුසලතා හා පන්නරය සමග මූලික න්‍යායන් හා සංකල්ප ගොඩනගා ගන්නේ පාසල් පද්ධතිය තුළින් ම ය. විශේෂයෙන් ම පාසල් අධ්‍යාපනයට තාක්ෂණ විෂය ඒකාබද්ධ වීම තුළ සිසු දරුවන් හා දෙමාපියන් තුළ මේ පිළිබඳ ගොඩනැගෙන පිළිගැනීම, විශ්වාසය සහ තරගකාරිත්වය තුළ දියුණු සංවර්ධිත රටවල ද්විතීයික අධ්‍යාපනය අවසානයේ තාක්ෂණ විෂය ධාරාවට හිමි ව ඇති පිළිගැනීමට සමාන පිළිගැනීමක් අප රට තුළ ද උදාවේය යන්න විෂය භාර ඇමතිවරයා ලෙස මාගේ එක ම බලාපොරොත්තුවයි.

විශේෂයෙන් ම අප ජීවත් වන මෙම 21 වන සියවස හැඳින්වෙන්නේ ආසියාවේ සියවස ලෙසයි. උදාවන ආසියාවේ සියවස පදනම් වන්නේ දැනුම මූලික කරගත් දැනුමේ ආර්ථිකය මතයි. උදාවන දැනුම් ආර්ථිකයේ මූලික ප්‍රාග්ධනය වශයෙන් බුද්ධිය, තාක්ෂණය, දැනුම හා නිපුණතා හැඳින්විය හැකි ය. මේ අනුව උදාවන ආසියාවේ සියවස තුළ දැනුමේ ආර්ථිකය මත පදනම් වූ නූතන සංවර්ධිත ශ්‍රී ලාංකීය රාජ්‍යයට අවශ්‍ය නිපුණ වෘත්තිකයන් සියලු දෙනා ම පාසල් පද්ධතිය තුළින් ම බිහිවේවා යන්න මාගේ ප්‍රාර්ථනයයි.

**ඩලස් අලහප්පෙරුම**
යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍ය

## ගරු අධ්‍යාපන අධීක්ෂණ මන්ත්‍රීතුමාගේ පණිවුඩය

ජාතික අධ්‍යාපන පද්ධතියට නව තාක්ෂණ විෂය ධාරාව හඳුන්වා දීමේ වැඩසටහන සඳහා පණිවුඩයක් නිකුත් කිරීමට අවස්ථාවක් ලැබීම සතුටට කාරණයක් ලෙස සලකමි.

අ.පො.ස. උසස් පෙළ සඳහා තාක්ෂණ විෂය ධාරාව හඳුන්වා දීම න්‍යායික බුද්ධියට අමතර ව ප්‍රායෝගික හැකියාව ඇති ශ්‍රී ලාංකික දරුවනට වදැගත් අවස්ථාවකි. අ.පො.ස. සාමාන්‍ය පෙළ ගණිතය හා විද්‍යාව ඇතුළුව විෂයයන් හයක් සමත් වීමත් ඉන් ඕනෑම විෂයයන් තුනක් සඳහා සම්මාන සාමාර්ථ ලබා සිටීමත් තාක්ෂණ විෂය ධාරාව සඳහා මූලික සුදුසුකම් වේ.

මූලික සිද්ධාන්ත පිළිබඳ අවබෝධය ලබානවාත් සමග ම ප්‍රායෝගික දැනුම ලබා ගැනීමත් වැඩ ලෝකයට අවතීර්ණ වීමට අවශ්‍ය තාක්ෂණය හා නිපුණතාව ලබා දීමත් මෙමගින් අරමුණු කෙරේ.

උසස් පෙළ ඉහළ ප්‍රතිඵල මත විශ්වවිද්‍යාලයටත් එසේ නොහැකි වුවහොත් කාර්මික හා වෘත්තීය කොමිෂන් සභාව යටතේ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ III) ලබා ගැනීමටත් මෙමගින් දරුවන්ට අවස්ථාව ලබා දී ඇත.

අවසාන වශයෙන් මෙම විෂය ධාරාව සකස් කර ගැනීමේ දී අපට සහාය දුන් සියලු ම අමාත්‍යාංශ, ජාතික අධ්‍යාපන ආයතනය සහ විශ්වවිද්‍යාලයන් හි අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සියලු දෙනාට මම මේ අවස්ථාවේ දී ස්තුතිවන්ත වෙමි.

**මොහාන් ලාල් ග්‍රේරු**
අධ්‍යාපන අධීක්ෂණ මන්ත්‍රී
අධ්‍යාපන අමාත්‍යාංශය
ඉසුරුපාය
බත්තරමුල්ල.

## අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ පණිවුඩය

ජාතික අධ්‍යාපන පද්ධතියට තාක්ෂණවේදය විෂය ධාරාව හඳුන්වා දෙන මෙම මොහොතේ මේ පණිවුඩය නිකුත් කරනුයේ ඉමහත් සොම්නසිනි.

අපගේ උපාධිධාරීන්ගේ නිපුණතා ඌනතාවන් ඔවුනට රැකියා ලබා ගැනීමේ දී බාධකයක් ව පවතී.

මෙම තත්ත්වය ශ්‍රී ලංකාවේ රජයට මෙන් ම ශ්‍රම වෙළෙඳපොළට ද තදින් බලපා ඇත.

මෙම තත්ත්වයට මුහුණ දීම මෙන් ම දිනෙන් දින ඉහළ යන ශ්‍රම ඉල්ලුමට පිළියමක් ලෙස කුසලතා පූර්ණ තරුණ පරපුරක් බිහි කිරීම සඳහා තෘතීයික අධ්‍යාපන මට්ටම සඳහා තාක්ෂණය විෂය ධාරාව ඇතුළත් කිරීමට රජය විසින් පියවර ගෙන ඇත.

රජයේ සැලැස්ම වන්නේ කලා විෂය ධාරාවන්ට ඇතුළත් වන ශිෂ්‍ය සංඛ්‍යාව ප්‍රගාමී ලෙස අඩු කර අනෙකුත් විෂය ධාරා සඳහා ඇතුළත් වීම් වැඩි කිරීම සඳහා විශ්වවිද්‍යාල, කාර්මික හා වෘත්තීය අධ්‍යාපන ආයතනය තුළ නව තාක්ෂණවේදය විෂය ධාරාවන් ද සහිත ව උසස් පෙළ සඳහා වෙන ම හඳුනා ගත යුතු විෂය ධාරාවක් වේ.

**එස්.එම්. ගෝඨාභය ජයරත්න**
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය
බත්තරමුල්ල.
2013. ජූනි 07 දින

## ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්
## මහාචාර්ය ඩබ්ලිව්.එම්. අබේරත්න බණ්ඩාර මහතාගේ පණිවුඩය

යෝජිත උසස් පෙළ තාක්ෂණවේදය විෂය ධාරාව හරහා ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපන ක්‍රමය තුළ පවතින්නාවූ ව්‍යුහාත්මක අසමතුලිතතාව ඉවත් කිරීමට ද, උසස් පෙළ විද්‍යා හා තාක්ෂණික අධ්‍යාපනය සඳහා පවතින අවස්ථාවන් වැඩි කරමින් කලා අංශයට ඇතුළත් වන්නාවූ ශිෂ්‍ය සංඛ්‍යාව අඩු කිරීමට ද හැකි වන නිසා එය ශ්‍රී ලාංකිය අධ්‍යාපනයෙහි හැරවුම් ලක්ෂ්‍යක් ලෙස සැලකිය හැකි වේ.

යුනෙස්කෝ ආයතනය හා ජාත්‍යන්තර කම්කරු සංවිධානය වර්ෂ 2002 දී ඉදිරිපත් කළ නිර්දේශවලින් තාක්ෂණික අධ්‍යාපනය හඳුන්වා දීමේ ඇති වැදගත්කම හඳුනාගෙන ඇත. වැඩ ලෝකයට හා තාක්ෂණික ලෝකයට හා එහි භාවිත වන්නා වූ මෙවලම්, අමුද්‍රව්‍ය, ශිල්පීය ක්‍රම සහ නිෂ්පාදන, බෙදාහැරීම් හා කළමනාකරණ ක්‍රියාවලීන් පිළිබඳ ව අවබෝධයක් ලබා ගැනීමට හැකි වන ආකාරයෙන් මෙම විෂය ධාරාව හඳුන්වා දීම මගින් හා සමස්තයක් ලෙස ප්‍රායෝගික අත්දැකීම් හරහා ලබා ගත හැකි දැනුම පදනම් කොට ගෙන අධ්‍යාපනය සඳහා වන අවස්ථාවන් පුළුල් කළ හැකි වන බව එම ආයතනවල නිර්දේශවල පැහැදිලි ව දැකිය හැකි ය.

ලෝකයේ බොහෝ රටවල් සිය ජ්‍යෙෂ්ඨ ද්විතීය අධ්‍යාපනය සඳහා තාක්ෂණික විෂය ධාරාව හඳුන්වා දී එහි ප්‍රතිලාභ සිය රටවල ආර්ථික සංවර්ධනය සඳහා දායක කොටගෙන ඇත. නව තාක්ෂණික විෂය ධාරාව යටතේ උසස් පෙළ සිසුනට ඉංජිනේරු තාක්ෂණවේදය, ජෛව පද්ධති තාක්ෂණවේදය හා තාක්ෂණවේදය සඳහා විද්‍යාව යන නව විෂයයන් හැදෑරීමට අවස්ථාව සැලසෙනු ඇත. එසේ ම එමගින් ජාතික වෘත්තීය සුදුසුකම් ලබාගනීමට ද අවස්ථාවක් සැලසෙන නිසා උසස් පෙළ විභාගයෙන් පසු වැඩ ලෝකයට අවතීර්ණ වීමට ද සිසුනට අස්ථාව සැලසේ.

නව තාක්ෂණවේදය විෂය ධාරාව හඳුන්වා දීමේ ඇති වැදගත්කම අවබෝධ කර ගනිමින් එම විෂය ධාරාව හඳුන්වා දීම සඳහා අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා, උසස් අධ්‍යාපන අමාත්‍යතුමා, වෘත්තීය හා තාක්ෂණික පුහුණු අමාත්‍යතුමා සහ අධ්‍යාපන අමාත්‍යතුමා විසින් ගන්නා ලද මූලික පියවරයන් මෙහිලා ඉතා අගය ලොට සලකමි.

අදාළ අමාත්‍යාංශ ලේකම් තුමන්ලාට ද, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති තුමියට ද, සියලු ම විශ්වවිද්‍යාල උප කුලපති තුමන්ලා හා තුමියන්ලාට ද, විෂයමාලා මණ්ඩලවල සියලු සාමාජික සාමාජිකාවන්ට හා මෙම කාර්යය සඳහා උපකාරී වූ අන් සියලු ම නිලධාරීන්ට ද මෙම කාර්යය සාර්ථක කර ගැනීම සඳහා ලබා දුන් මහඟු උපකාරයට ස්තුති කිරීමට ද මෙය අවස්ථාවක් කරගනු කැමැත්තෙමි.

**මහාචාර්ය ඩබ්ලිව්.එම්. අබේරත්න බණ්ඩාර**
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

## හැඳින්වීම

යුනෙස්කෝ ආයතනය හා ජාත්‍යන්තර කම්කරු සංවිධානය වර්ෂ 2002 දී ඉදිරිපත් කළ නිර්දේශවලින් තාක්ෂණික අධ්‍යාපනය හඳුන්වා දීමේ ඇති වැදගත්කම හඳුනාගෙන ඇත. වැඩ ලෝකයට හා තාක්ෂණික ලෝකයට හා එහි භාවිත වන්නා වූ මෙවලම්, අමුද්‍රව්‍ය, ශිල්පීය ක්‍රම සහ නිෂ්පාදන, බෙදාහැරීම් හා කළමනාකරණ ක්‍රියාවලින් පිළිබඳ ව අවබෝධයක් ලබා ගැනීමට හැකිවන ආකාරයෙන් මෙම විෂය ධාරාව හඳුන්වා දීම මගින් හා සමස්තයක් ලෙස ප්‍රායෝගික අත්දැකීම් හරහා ලබාගත හැකි දැනුම පදනම් කොට ගෙන අධ්‍යාපනය සඳහා වන අවස්ථාවන් පුළුල් කළ හැකිවන බව එම ආයතන නිකුත් කළ නිර්දේශවල පැහැදිලි ව දැකිය හැකි ය.

ද්විතීය සහ ඉහළ ද්විතීය අධ්‍යාපනය සඳහා තාක්ෂණික විෂයන් ඇතුළත් කිරීම මගින් ලෝකයේ බොහෝ රටවල මෙය ප්‍රදර්ශනය කර ඇත. මේ පිළිබඳ ආසියානු රටක් ලෙස මැලේසියාව උදාහරණයක් ලෙස දැක්විය හැකි ය. තෝරා ගැනීම සඳහා තාක්ෂණික විෂයයන් විශාල සංඛ්‍යාවක් සාමාන්‍ය පෙළ මට්ටමේ දී ඉදිරිපත් කර ඇති අතර, එය සිසුන් වැඩ ලෝකයට යොමු කිරීමේ ආරම්භයක් ලෙස හැඳින්විය හැකි වුවත් වැඩිදුර අධ්‍යාපනය සඳහා එමගින් ලැබෙන පිටුවහල ප්‍රමාණවත් නොවේ.

යෝජිත උසස් පෙළ තාක්ෂණවේදය විෂය ධාරාව ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය නව මංපෙතකට යොමු කරවන සන්ධිස්ථානයක් වන්නේ එමගින් දැනට 51% පමණ වන කලා විෂයය ධාරාව හදාරණ සිසුන්ගේ ප්‍රමාණය අවම කර, තාක්ෂණවේදය සහ විද්‍යා විෂය ධාරාවන් හදාරණ සිසුන් ප්‍රමාණය වසර 2016 දී 40% දක්වා වර්ධනය කර ගැනීම ප්‍රධාන ඉලක්කයක් වන බැවිනි.

යෝජිත උසස් පෙළ තාක්ෂණවේදය විෂය ධාරාව පැහැදිලි ලෙස ම උසස් පෙළ සඳහා වූ වෙන ම විෂය ධාරාවක් වන අතර එමගින් තාක්ෂණවේදයට අදාළ පුළුල් විෂය ක්ෂේත්‍ර ආවරණය කරනුයේ අත්‍යවශ්‍ය වන ආධාරක විෂයයන් ද සමග ය. අධ්‍යාපන අමාත්‍යාංශය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ ජාතික අධ්‍යාපන ආයතනය අතර පැවැත් වූ සාකච්ඡාවල ප්‍රතිඵලයක් ලෙස පුළුල් තාක්ෂණවේද ක්ෂේත්‍ර කිහිපයක් ආවරණය වන පරිදි විෂයන් හඳුනාගෙන ඇත. ඒවානම් ඉංජිනේරු තාක්ෂණවේදය සහ ජීව පද්ධති තාක්ෂණවේදය වේ. මේ අතුරින් එක් විෂයක් තෝරා ගැනීමට හැකිවන අතර, දෙවන විෂය වශයෙන් තාක්ෂණවේදය සඳහා විද්‍යාව තුළින් අවශ්‍ය මූලික විද්‍යාව, ගණිතය සහ තොරතුරු තාක්ෂණය පිළිබඳ ප්‍රමාණවත් දැනුම කුසලතා ලබා දෙනු ඇත. තුන්වන විෂයය වශයෙන් දැනටමත් උසස් පෙළ විෂයය ධාරාව තුළ ක්‍රියාත්මක වන විෂයය 11ක් අතුරින් එකක් තෝරා ගැනීමට අවස්ථාව සිසුන්ට ලැබී ඇත.

තාක්ෂණවේදය විෂය ධාරාවේ ව්‍යුහය පහත සඳහන් පරිදි වේ:

1. ඉංජිනේරු තාක්ෂණවේදය /ජෛව පද්ධති තාක්ෂණවේදය (එක් විෂයයක් පමණක් තෝරා ගත යුතු ය.)
2. තාක්ෂණවේදය සඳහා විද්‍යාව

3. පහත සඳහන් විෂයන්ගෙන් එක් විෂයක් තෝරා ගත යුතු වේ.

- ආර්ථික විද්‍යාව
- භූගෝලය
- ගෘහ ආර්ථික විද්‍යාව
- ඉංග්‍රීසි භාෂාව
- සන්නිවේදනය සහ මාධ්‍ය අධ්‍යයනය
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
- චිත්‍ර
- ව්‍යාපාර අධ්‍යයනය
- කෘෂිවිද්‍යාව
- ගණකාධිකරණය

අරමුණු :

- එදිනෙදා ජීවිතයේ දී අවශ්‍යවන තාක්ෂණික කුසලතා වර්ධනය කිරීම.
- සැබෑ වැඩ ලෝකයේ පවතින ගැටලු සඳහා තාක්ෂණික විසඳුම් ලබාදීමට අවශ්‍ය කරන කුසලතා වර්ධනය කිරීම.
- රැකියා පාදක කුසලතා වර්ධනය කිරීම.
- සිසුන්ගේ වෘත්තීය අධ්‍යාපනය ජාතික වෘත්තීය සුදුසුකම් රාමුව සමඟ සම්බන්ධ කරගනිමින් පද්ධතියට ගෙනයාමට අවස්ථාව සැලසීම.

**තක්සේරුකරණය**

පාසල් පාදක ඇගයීම් ක්‍රියාවලිය පාසල්වල ක්‍රියාත්මක වන අතර මේ පිළිබඳ අදාළ උපදෙස් සහ ආකෘති ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය සමඟ ඉදිරියේ දී ලබාදෙනු ඇත.

**ඇගයීම**

ඇගයීම විභාග දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ලබන අතර ආකෘති ප්‍රශ්න පත්‍ර, ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය සමඟ ලබාදෙනු ඇත. කෙසේ වෙතත් ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 75% ද ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ලකුණු 25% ද හිමිවනු ඇත.

**තාක්ෂණ අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**ජාතික අධ්‍යාපන ආයතනය**
**මහරගම.**
**15 ජුනි 2013**

## 2.0 ජාතික පොදු අරමුණු:

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟාවීම සඳහා පුද්ගලයින්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතිය සහාය විය යුතු ය.

වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබී ය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලින් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟා කර ගත යුතු පහත දැක්වෙන අරමුණු සපුරා ගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

I. මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩ නැගීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම

II. වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම

III. මානව අයිතිවාසිකම් ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයංගම බැඳීමකින් යුතුව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම

IV. පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත් සහ මානව අගයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

V. සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම

VI. පුද්ගලයාගේ සහ ජාතියේ ජීව ගුණය වැඩි දියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායි කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම

VII. ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැස්වීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සුදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

VIII. ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම

## 3.0 මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු ඉටුකර ගැනීමට දායක වනු ඇත.

(I) සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය මත තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් කර ගනී.

| | | |
|---|---|---|
| සාක්ෂරතාව | : | සාවධාන ව ඇහුම්කන් දීම පැහැදිලි ව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම |
| සංඛ්‍යා පිළිබඳ දැනුම | : | භාණ්ඩ, අවකාශය හා කාලය ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය |
| රූපක භාවිතය | : | රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම |
| තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව | : | පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද සේවා පරිශ්‍රයක් තුළ දී ද පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම |

(II) පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා

- නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තීන්, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයාගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්
- චිත්තවේගී බුද්ධිය

(III) පරිසරයට අදාළ නිපුණතා

මෙම නිපුණතා සාමාජික ජෛව සහ භෞතික පරිසරයට අදාළ වේ.

| | | |
|---|---|---|
| සමාජ පරිසරය | : | ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පෞද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම් |
| ජෛව පරිසරය | : | සජීවී ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුද, ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා |
| භෞතික පරිසරය | : | අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, අවබෝධය, සංවේදිතාව හා කුසලතාව |

ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

(IV) වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා

ආර්ථික සංවර්ධනයට දායක වීම
තම වෘත්තීය ළැදියා සහ අභියෝග්‍යතා හඳුනා ගැනීම
හැකියාවනට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ
වාසිදායක හා තිරසර ජීවනෝපායක නිරත වීම
යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා

(V) ආගම සහ සදාචාර ධර්මයන්ට අදාළ නිපුණතා

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය

(VI) ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

(VII) "ඉගෙනීමට ඉගෙනුම" පිළිබඳ නිපුණතා

ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයන්ට ශක්තිය ලබා දීම.

**ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති රාමුවක් සඳහා යෝජනා ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව (2003 දෙසැම්බර්)**

# පටුන


| | | පිටුව |
|---|---|---|
| **12 වන ශ්‍රේණිය** | | |
| **ඒකකය** | | |
| 01. | ක්ෂුද්‍රජීව විද්‍යාව | 01 |
| 02. | ජෛවාණුවල වැදගත්කම | 02 |
| 03. | මූලික ගණිතය | 04 |
| 04. | පයිතගරස් සම්බන්ධතාව | 04 |
| 05. | මිනුම් ශිල්පක්‍රම | 05 |
| 06. | තාප රසායනයේ මූලික සංකල්ප | 05 |
| 07. | පරිගණකය | 07 |
| 08. | පරිගණක මෙහෙයුම් පද්ධතිය | 08 |
| 09. | ත්‍රිකෝණමිතික අනුපාත | 10 |
| 10. | තාපය | 12 |
| 11. | චාලක රසායනයේ මූලික සංකල්ප | 12 |
| 12. | බහුඅවයවික ද්‍රව්‍ය | 14 |
| 13. | මෘදුකාංග භාවිතය | 15 |
| 14. | අන්තර්ජාලය සහ සන්නිවේදනය | 21 |
| 15. | බලය | 22 |
| **13 වන ශ්‍රේණිය** | | |
| **ඒකකය** | | |
| 16. | යාන්ත්‍රික ශක්තිය | 24 |
| 17. | ද්‍රවස්ථිති විද්‍යාව | 24 |
| 18. | ස්වභාව නිෂ්පාදන | 25 |
| 19. | ඛණ්ඩාංක ජ්‍යාමිතිය | 25 |
| 20. | පදාර්ථයේ යාන්ත්‍රික ගුණ | 26 |
| 21. | විද්‍යුතය හා චුම්භකත්වය | 27 |
| 22. | රසායනික කර්මාන්ත | 28 |
| 23. | චලිතය | 29 |
| 24. | නැනෝ තාක්ෂණය | 30 |
| 25. | සංඛ්‍යානය | 31 |
| 26. | තාක්ෂණික දියුණුව හා පරිසරය | 32 |

| නිපුණතාව | ksපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | ඉගනුම් ඵල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1.0 ක්ෂුද්‍රජීවීන් හඳුනා ගෙන ඔවුන්ගේ භාවිත පැහැදිලි කරයි. | 1.1 ක්ෂුද්‍රජීවීන්ගේ ස්වභාවය හා විවිධත්වය අනාවරණය කරයි. | • ප්‍රධාන ක්ෂුද්‍රජීවී කාණ්ඩ<br>• බැක්ටීරියා<br>• දිලීර<br>• ප්‍රොටෝසෝවා<br>• ඒක සෛලික ඇල්ගී<br>• සූත්‍රිකාකාර ඇල්ගී<br>• වෛරස | • ක්ෂුද්‍රජීවීන් ප්‍රධාන කාණ්ඩවලට වර්ග කරයි.<br>• ක්ෂුද්‍රජීවී කාණ්ඩ සඳහා උදාහරණ දක්වයි.<br>• රූපසටහන් ආධාර කර ගනිමින් ප්‍රධාන ක්ෂුද්‍රජීවී කාණ්ඩවලට අයත් ලාක්ෂණික විස්තර කරයි. | 12 |
| | 1.2 මානව වර්ගයාගේ යහපැවැත්ම සඳහා ක්ෂුද්‍රජීවවිද්‍යාවේ භාවිත ගවේෂණය කරයි. | • ක්ෂුද්‍රජීවවිද්‍යාව<br>• හැඳින්වීම<br>• භාවිතය<br>• ආහාර හා කෘෂි ක්ෂේත්‍රය<br>• වෛද්‍ය ක්ෂේත්‍රය<br>• ජෛව ප්‍රතිකාර<br>• අපජලය පිරියම් කිරීම<br>• ජෛව බහුඅවයවික<br>• ජාන ඉංජිනේරු තාක්ෂණය<br>• ශක්තිය හා ක්ෂුද්‍රජීවීන් | • විවිධ ක්ෂේත්‍රවල ක්ෂුද්‍රජීවවිද්‍යාවේ භාවිත විස්තර කරයි.<br>• ජෛව ප්‍රතිකාර ක්‍රියාවලිය විස්තර කරයි.<br>• ශක්ති සම්පත්වල තිරසාර භාවිතය සඳහා වූ ක්ෂුද්‍ර ජීවීන්ගේ භාවිත පැහැදිලි කරයි.<br>• ජාන ඉංජිනේරුකරණය සඳහා ක්ෂුද්‍රජීවීන්ගේ භාවිත විස්තර කරයි. | 10 |

| නිපුණතාව | Nපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | ඉගනුම් ඵල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 2.0 ජෛවාණුවල ව්‍යුහය, වැදගත්කම හා භාවිත ගවේෂණය කරයි. | 2.1 කාබෝහයිඩ්‍රේට්වල ව්‍යුහය ගවේෂණය කරයි. | • ජෛවාණු හැඳින්වීම<br>• කාබොහයිඩ්‍රේට<br>  • මොනොසැකරයිඩ<br>  • ඩයිසැකරයිඩ<br>  • පොලිසැකරයිඩ | • ජෛව රසායන විද්‍යාව හඳුන්වයි.<br>• ජෛවාණුවක් යනු කමක්දැයි විස්තර කරයි.<br>• කාබෝහයිඩ්‍රේට හඳුන්වා ඒවා මොනොසැකරයිඩ, ඩයිසැකරයිඩ හා පොලිසැකරයිඩ ලෙස වර්ග කරයි.<br>• මොනොසැකරයිඩ, ඩයිසැකරයිඩ හා පොලිසැකරයිඩ සඳහා නිදසුන් සපයයි.<br>• කාබෝහයිඩ්‍රේටයක අඩංගු සංඝටක මූලද්‍රව්‍ය නම් කරයි.<br>• පොලිසැකරයිඩවල අන්තර්ගත විශේෂිත කාණ්ඩ හා බන්ධන නම් කරයි.<br>• දෙනලද ජෛවාණු අතරින් පොලිසැකරයිඩ අණු හඳුනා ගනියි.<br>• සරල සීනි හඳුනා ගැනීමේ පරීක්ෂාව සිදු කරයි.<br>• කාබෝහයිඩ්‍රේටවල ලාක්ෂණික ගුණ විස්තර කරයි. | 04 |
| | 2.2 ප්‍රෝටීනවල ව්‍යුහය ගවේෂණය කරයි. | • ප්‍රෝටීන<br>  • ඇමයිනෝ අම්ල<br>  • ප්‍රෝටීන හා ඒවායේ ව්‍යුහ මට්ටම්<br>  • එන්සයිම | • ඇමයිනෝ අම්ල අණුවක අන්තර්ගත ප්‍රධාන ක්‍රියාකාරී කාණ්ඩ හඳුනා ගනියි.<br>• ප්‍රෝටීනයක අඩංගු සංඝටක මූලද්‍රව්‍ය නම් කරයි.<br>• ප්‍රෝටීනවල අන්තර්ගත විශේෂිත කාණ්ඩ හා බන්ධන නම් කරයි.<br>• දෙන ලද ජෛවාණු අතරින් ප්‍රෝටීන අණු හඳුනා ගනියි.<br>• ප්‍රෝටීනයක ප්‍රාථමික හා ද්විතීයක ව්‍යුහ විස්තර කරයි.<br>• එන්සයිම හඳුන්වයි. | 04 |

| නිපුණතාව | ‍නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගනුම් ඵල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | 2.3 ලිපිඩවල ව්‍යුහය ගවේෂණය කරයි. | • ලිපිඩ<br>• ලිපිඩවල සංරචක හා ව්‍යුහය<br>• පැවැත්ම<br>• මේද සහ තෙල් | • ලිපිඩ හඳුන්වයි.<br>• ලිපිඩවල අඩංගු ප්‍රධාන සංඝටක මූලද්‍රව්‍ය නම් කරයි.<br>• ලිපිඩවල අන්තර්ගත ප්‍රධාන කාණ්ඩ හා බන්ධන නම් කරයි.<br>• ලිපිඩ අණුවක් නිර්මාණය වී ඇති ආකාරය විස්තර කරයි.<br>• දෙන ලද ජෛවාණු අතරින් ලිපිඩ අණු හඳුනා ගනියි.<br>• ලිපිඩ මගින් ජෛව දේහ තුළ ඉටු කෙරෙන කෘත්‍ය ප්‍රකාශ කරයි.<br>• සරල පරීක්ෂා ඇසුරෙන් ලිපිඩ හඳුනා ගනියි. | 03 |
| | 2.4 ජෛවාණුවල වැදගත්කම සහ භාවිත ගවේෂණය කරයි. | • කාබෝහයිඩ්රේට්වල වැදගත්කම<br>• ජෛව පද්ධතිවල දී<br>• කර්මාන්තවල දී<br>• ප්‍රෝටීනවල වැදගත්කම<br>• ජෛව පද්ධතිවල දී<br>• කර්මාන්තවල දී<br>• ලිපිඩවල වැදගත්කම<br>• ජෛව පද්ධතිවල දී<br>• කර්මාන්තවල දී<br>• එන්සයිමවල වැදගත්කම<br>• ජෛව පද්ධතිවල දී<br>• කර්මාන්තවල දී<br>• ජෛව පද්ධතිවල දී විටමින්වල වැදගත්කම | • කාබෝහයිඩ්රේට, ප්‍රෝටීන, ලිපිඩ, එන්සයිම හා විටමින්වල වැදගත්කම විස්තර කරයි.<br>• එන්සයිම නිර්වචනය කරයි.<br>• එන්සයිමවල උත්ප්‍රේරක ගුණය විස්තර කරයි.<br>• එන්සයිමවල ක්‍රියාව කෙරෙහි බලපාන සාධක ලැයිස්තු ගත කරයි.<br>• කර්මාන්තවල දී යොදා ගන්නා එන්සයිම නම් කරයි.<br>• කර්මාන්ත ක්ෂේත්‍රයේ දී එන්සයිම භාවිතයේ වාසි විස්තර කරයි.<br>• විටමින්වල වැදගත්කම සඳහන් කරයි. | 04 |

| නිපුණතාව | ksපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | ඉගනුම් ඵල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 3.0 වර්ගඵලය හා පරිමාව පිළිබඳ විමර්ශනය කරමින් සීමිත ඉඩකඩක් ප්‍රශස්ත මට්ටමින් භාවිත කරයි. | 3.1 ජ්‍යාමිතික හැඩතලවල සහ ඝන වස්තුවල පෘෂ්ඨ වර්ගඵල විමර්ශනය කරයි. | • ජ්‍යාමිතික හැඩතලවල වර්ගඵලය<br>• ඝන වස්තුවල පෘෂ්ඨ වර්ගඵලය (සිලින්ඩරය, ඝනකය, ඝනකාභය, ගෝලය, පිරමීඩය, ප්‍රිස්මය, කේතුව සූත්‍ර භාවිතයෙන්)<br>• සංයුක්ත ඝන වස්තුවල පෘෂ්ඨ වර්ගඵලය | • ජ්‍යාමිතික හැඩතලවල පෘෂ්ඨ වර්ගඵල සොයයි.<br>• ඝන වස්තුවල පෘෂ්ඨ වර්ගඵල සොයයි.<br>• සංයුක්ත ඝන වස්තුවල පෘෂ්ඨ වර්ගඵල සොයයි.<br>• සංයුක්ත ඝන වස්තුවල පෘෂ්ඨ වර්ගඵල ආශ්‍රිත ගැටලු විසඳයි. | 06 |
| | 3.2 ඝන වස්තුවල පරිමාව අනාවරණය කරයි. | • ඝන වස්තුවල පරිමාව (සිලින්ඩරය, ඝනකය, ඝනකාභය, ගෝලය, පිරමීඩය, කේතුව, ප්‍රිස්මය සූත්‍ර භාවිතයෙන්)<br>• සංයුක්ත ඝන වස්තුවල පරිමාව | • දෙන ලද ඝන වස්තුවල පරිමාව සොයයි.<br>• සංයුක්ත ඝන වස්තුවල පරිමාව සොයයි.<br>• සංයුක්ත ඝන වස්තුවල පරිමාව ආශ්‍රිත ගැටලු විසඳයි. | 06 |
| 4.0 පයිතගරස් සම්බන්ධතාවය භාවිතයෙන් පහසුවෙන් ගැටලු විසඳයි. | 4.1 සෘජුකෝණික ත්‍රිකෝණයක පාද අතර සම්බන්ධතාව විමසා බලයි. | • පයිතගරස් සම්බන්ධතාව හා එහි භාවිත | • පයිතගරස් සම්බන්ධතාව භාවිතයෙන් ත්‍රිකෝණයක පාදවල දිග ගණනය කරයි.<br>• ගැටලු විසඳීම සඳහා පයිතගරස් සම්බන්ධතාව භාවිත කරයි.<br>• පයිතගරස් සම්බන්ධතාවේ විලෝමය ප්‍රකාශ කරයි.<br>• ගැටලු විසඳීම සඳහා පයිතගරස් සම්බන්ධතාවේ විලෝමය භාවිත කරයි. | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගනුම් ඵල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 5.0 මිනුම් අවශ්‍යතා සඳහා අදාළ ශිල්පීය ක්‍රම යොදා ගනියි. | 5.1 යෝග්‍ය උපකරණ භාවිතයෙන් කුඩා මිනුම් ලබා ගනියි. | • ව'නියර කැලිපරය<br>• මයික්‍රොමීටර ඉස්කුරුප්පු ආමානය<br>• චල අන්වීක්ෂය<br>• තෙදඬු තුලාව<br>• ඉලෙක්ට්‍රොනික තුලාව | • මිනුම් උපකරණවල කුඩාම මිනුම සොයා ගනියි.<br>• උපකරණයකින් මිනුම් ලබා ගැනීමේ නියමිත ක්‍රියාමාර්ග අනුගමනය කරයි.<br>• උපකරණයේ මූලාංක වරද සොයා මිනුම නිවැරදි කර ගනියි.<br>• භාගික දෝෂය යන්න හඳුනා ගනිමින් කුඩා මිනුමක් වඩාත් නිවැරදි ව ගැනීමේ අවශ්‍යතාව පෙන්වා දෙයි.<br>• ප්‍රතිශත දෝෂය ගණනය කරයි.<br>• කුඩා ප්‍රමාණයේ මිනුම් ලබා ගැනීමේ දී ඒ සඳහා සුදුසු උපකරණ භාවිතය අගය කරයි. | 08 |
| 6.0 තාප රසායනය හා සම්බන්ධ මූලික සංකල්ප ගවේෂණය කරයි. | 6.1 භෞතික විපර්යාස හා සම්බන්ධ තාප විපර්යාස පරීක්ෂා කිරීමට තාප රසායනයේ මූලික සංකල්ප භාවිත කරයි. | • තාප රසායනය හා සම්බන්ධ මූලික සංකල්ප<br>  • තාපය, කාර්යය, ශක්තිය<br>  • පද්ධතිය, පරිසරය (වටපිටාව) හා මායිම<br>• අවස්ථා විපර්යාස<br>  • විලීන වීම<br>  • මිදීම<br>  • ඌර්ධ්වපාතනය<br>  • ප්‍රතිඌර්ධ්වපාතනය<br>  • වාෂ්පීකරණය<br>  • ඝනීභවනය | • තාපය, කාර්යය, ශක්තිය, පද්ධතිය, මායිම හා වටපිටාව යන පද අර්ථ දක්වයි.<br>• මායිම හරහා පදාර්ථ හා ශක්ති හුවමාරු වන පද්ධතියක් විවෘත පද්ධතියක් ලෙස හඳුන්වයි.<br>• මායිම හරහා ශක්තිය පමණක් හුවමාරු වන පද්ධතියක් සංවෘත පද්ධතියක් ලෙස හඳුන්වයි.<br>• මායිම හරහා පදාර්ථය හා ශක්තිය හුවමාරු නොවන පද්ධතියක් ඒකලිත පද්ධතියක් ලෙස හඳුන්වයි.<br>• පද්ධතියේ හා වටපිටාවේ එකතුව විශ්වය බව ප්‍රකාශ කරයි.<br>• විලීන වීම, මිදීම, ඌර්ධ්වපාතනය, ප්‍රතිඌර්ධ්වපාතනය, වාෂ්පීකරණය, සංඝනීභවනය යන භෞතික විපර්යාස අර්ථ දක්වයි.<br>• අවස්ථා විපර්යාස පිළිබඳ අණුක මට්ටමේ විග්‍රහයක යෙදෙයි. | 05 |

| නිපුණතාව | ksපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | ඉගනුම් ඵල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | 6.2 ප්‍රතික්‍රියා තාපය පරීක්ෂණාත්මක ව නිර්ණය කරයි. | • ප්‍රතික්‍රියා තාපය<br>• තාපදායක හා තාපාවශෝෂක ප්‍රතික්‍රියා<br>• ශක්ති පැතිකඩ<br>• ප්‍රතික්‍රියා තාපයේ භාවිත | • ප්‍රතික්‍රියා තාපය යන්න විස්තර කරයි.<br>• තාපදායක හා තපාවශෝෂක ප්‍රතික්‍රියා උදාහරණ ඇසුරින් පැහැදිලි කරයි.<br>• තාපදායක හා තපාවශෝෂක ප්‍රතික්‍රියා ආදර්ශනය කරයි.<br>• අම්ල-භස්ම ප්‍රතික්‍රියා ආශ්‍රිත, ප්‍රතික්‍රියා තාපය පරීක්ෂණ ඇසුරින් ගණනය කරයි.<br>• ප්‍රතික්‍රියා ආශ්‍රිත තාප විපර්යාස ගණනය කිරීමේ දී සිදුකළ උපකල්පන ප්‍රකාශ කරයි.<br>• ප්‍රතික්‍රියාවක් ආශ්‍රිත තාප විපර්යාසය ශක්ති රූපසටහනකින් නිරූපණය කරයි.<br>• ප්‍රතික්‍රියා තාපයේ භාවිත උදාහරණ ඇසුරින් විස්තර කරයි.<br>• ප්‍රතික්‍රියා තාපය පිළිබඳ හැදෑරීම් දෛනික ජීවිතයේ දී හා වැඩ ලෝකයේ දී ප්‍රයෝජනවත් වන බව පිළිගනියි. | 07 |

| නිපුණතාව | ksපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | ඉගනුම් ඵල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 7.0 පරිගණක පද්ධතියක් සහ උපාංග ඵලදායී ලෙස භාවිත කිරීම සඳහා ගවේෂණය කරයි. | 7.1 පරිගණකය හඳුන්වා එහි ආදාන හා ප්‍රතිදාන උපක්‍රම විස්තර කරයි. | • පරිගණකය හඳුන්වාදීම<br>• පරිගණකය, පද්ධතියක් ලෙස<br>  • ආදාන<br>  • සැකසුම<br>  • ප්‍රතිදාන<br>• පුද්ගල පරිගණකයක මූලික උපක්‍රම<br>  • තිරය<br>    • තිර වර්ග CRT, LCD, LED<br>  • පද්ධති ඒකකය (System Unit)<br>    • මව් පුවරුව, සකසුව<br>      • සසම්භාවී ප්‍රවේශ මතකය (RAM)<br>      • පඨන මාත්‍ර මතකය (ROM)<br>      • දෘඪ තැටිය<br>      • දිගුපත්, විදුලි යැපයුම් ඒකකය<br>    • යතුරු පුවරුව (විවිධ වර්ග)<br>    • දර්ශක උපක්‍රම (Pointing devices)<br>      • මූසිකය<br>      • මාර්ග ගුලාව (Track ball)<br>      • ස්පර්ශ පැනලය (Touch panel)<br>    • අනෙකුත්- ආදාන ප්‍රතිදාන උපක්‍රම<br>  • ප්‍රතිදාන<br>    • මුද්‍රණ යන්ත්‍රය, ප්ලෝටරය, ස්පීකරය, තිරය<br>    • ප්‍රතිදාන<br>    • මුද්‍රණ යන්ත්‍රය, ප්ලෝටරය, ස්පීකරය, තිරය | • පරිගණකය පද්ධතියක් ලෙස විස්තර කරයි.<br>• ආදාන, ප්‍රතිදාන හා සැකසුම් ලෙස දෘඪාංග වර්ගීකරණය කරයි.<br>• භාවිත කරන්නාගේ අවශ්‍යතාවයට අනුව උපක්‍රම තෝරා ගනියි.<br>• පරිගණකයේ සාමාන්‍ය දෝෂ නිවැරදි කරයි.<br>• ප්‍රමාණය හා කෙරෙන කාර්යය අනුව පරිගණක වර්ග කරයි. | 03 |

| නිපුණතාව | ĸපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | ඉගනුම් ඵල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 8.0. පරිගණක මෙහෙයුම් පද්ධතිය සමග ඵලදායී ලෙස කටයුතු කරයි. | 8.1 පරිගණක මෙහෙයුම් පද්ධතිය හඳුන්වා එහි කාර්යය විස්තර කරයි. | • ආචයන උපක්‍රම (Storage Devices)<br>• ආචයන මාධ්‍ය<br>• චුම්භකිත<br>• ප්‍රකාශ (Optical)<br>• වෙනත්<br>• ආදාන<br>• සුපරීක්සකය, මයික්‍රොෆෝනය තීරු කේත කියවනය<br>• විවිධ පරිගණක වර්ග<br>• ක්ෂුද්‍ර පරිගණක<br>• උකුල මත පරිගණක (Laptop)<br>• මේස මත පරිගණක (Desktop)<br>• ටැබ්/ අත්ල මත පරිගණක (Palmtop)<br>• නෝට් බුක් පරිගණක<br><br>• මෙහෙයුම් පද්ධතියක අවශ්‍යතාව<br>• බලගැන්වීමේ ක්‍රියාවලිය (Booting Process)<br>• චිත්‍රක අතුරු මුහුණත (GUI) (Graphical User Interface)<br>• විධාන රේඛා මුහුණත (Command line interface)<br>• විවිධ මෙහෙයුම් පද්ධති Windows, Linux, MacOS, DOS<br>• විවෘත කේත මෙහෙයුම් පද්ධති Linux, Ubuntu, Fedora, Hanthana,<br>• මෙහෙයුම් පද්ධතියක ගති ලක්ෂණ (Characteristics)<br>• මතක කළමනාකරණය<br>• උපක්‍රම කළමනාකරණය<br>• ගොනු කළමනාකරණය | • මෙහෙයුම් පද්ධතියක් ක්‍රියා කරන ආකාරය හා භාවිත කරන ආකාරය විස්තර කරයි.<br>• පරිගණකයේ විවිධ සංරචක නම් කර ඒවා මෙහෙයුම් පද්ධතිය සමග ඇති අන්තර් ක්‍රියාකාරීත්වය පැහැදිලි කරයි.<br>• විවිධ වර්ගවල මෙහෙයුම් පද්ධති විස්තර කර ප්‍රධාන වශයෙන් භාවිත වන මෙහෙයුම් පද්ධති නම් කරයි.<br>• මෙහෙයුම් පද්ධතිය සහ ප්‍රධාන මතකය අතර අන්තර්ක්‍රියාව සිදුවන ආකාරය සාකච්ඡා කරයි.<br>• ගොනු පද්ධතිය සහ එහි කාර්යය විස්තර කරයි.<br>• පරිගණකය සහ එහි විවිධ සංරචකවල පිරිවිතර නම් කරයි.<br>• දෝෂ කළමනාකරණය පැහැදිලි කරයි. | 03 |

| නිපුණතාව | **නිපුණතා මට්ටම** | විෂය අන්තර්ගතය | **ඉගනුම් ඵල** | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | | • පරිශීලක කළමනාකරණය<br>• ආරක්ෂාව<br>• පද්ධති කාර්ය සාධනය කළමනාකරණය<br>• වැරදි අනාවරණය කර ගැනීම<br>• අනෙකුත් මෘදුකාංග හා පරිශීලන අතර අන්තර් සම්බන්ධය ගොඩ නැගීම | | |
| | 8.2 පරිගණක මෙහෙයුම් පද්ධතියක් භාවිත කරයි. | • මෙහෙයුම් පද්ධති හඳුනා ගැනීම<br>• ගොනු කළමනාකරණය<br>• මෙහෙයුම් පද්ධතියට දෘඪාංග සම්බන්ධ කිරීම | • මෙහෙයුම් පද්ධතියේ කොටස් (Desktop, Explorer, Controls) හඳුනා ගනියි.<br>• ගොනු බහලුම් (Folder) නිර්මාණය කරයි. එහි උපගොනු බහාලුම් (sub folder) සකස් කරයි.<br>• ධාවකය (Drive), ගොනුව සහ ගොනු බහාලුම හඳුනා ගනියි.<br>• ගොනුවේ කොටස් හඳුනා ගනියි.<br>• ගොනු බහාලුම් ආකෘතිය Explorer හෝ Nautilus තුළින් හෝ නිරීක්ෂණය කර වෙනස් කරයි.<br>• ධාවකය, ගොනුව සහ ගොනු බහාලුම් විධාන රේඛා (Command Line) භාවිතයෙන් හඳුනා ගනියි.<br>• USB Mouse (USB මූසිකය), Pen Drive (සැනෙලි මතක උපක්‍රම), Printer (මුද්‍රකය) HSDPA dongle ආදිය පරිගණකයට එක් කරන අවස්ථාවේ මෙහෙයුම් පද්ධතියේ හැසිරීම නිරීක්ෂණය කරයි.<br>• Control පැනලය භාවිතයෙන් මෙහෙයුම් පද්ධතියේ විවිධ අංග පිළිබඳව සොයා බලයි. | 04 |

| නිපුණතාව | **ksපුණතා මට්ටම** | විෂය අන්තර්ගතය | **ඉගනුම් ඵල** | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | | | • මූසිකය (Mouse)<br>• ශබ්ද (Sound)<br>• Personalization<br>• දිනය සහ වේලාව (Date & Time)<br>• Folder Option<br>• හඬ හඳුනා ගැනීම (Speech Recognition)<br>• පරිශීලක ගිණුම (User Accounts)<br>• Task Manager භාවිත කර හෝ ලිනක්ස්වල දී ps-A භාවිත කර මෙහෙයුම් පද්ධතියේ මෙහෙයුම් (Process) පිළිබඳව සොයා බැලීමට සහ ක්‍රියායන නවතා තැබීමට හැකි බව හඳුනා ගනියි. | |
| 9.0 එදිනෙදා ජීවිතයේ කාර්යය ත්‍රිකෝණමිතික අනුපාත භාවිතයෙන් පහසු කර ගනියි. | 9.1 ත්‍රිකෝණමිතික අනුපාත විස්තර කරයි. | • කෝණ මිනුම් වන අංශක හා රේඩියන හැඳින්වීම<br>• සයිනය, කෝසයිනය හා ටැංජනය යන ත්‍රිකෝණමිතික අනුපාත හැඳින්වීම<br>• $0, \frac{\pi}{6}, \frac{\pi}{4}, \frac{\pi}{3}, \frac{\pi}{2}$ කෝණවල ත්‍රිකෝණමිතික අනුපාත (sin, cos, tan) | • කෝණ මිනුම් ලෙස අංශක සහ රේඩියනය හඳුනා ගනියි.<br>• සයිනය, කෝසයිනය, ටැංජනය යන ත්‍රිකෝණමිතික අනුපාත හඳුන්වයි.<br>• ත්‍රිකෝණමිතික අනුපාත භාවිත කර ගැටලු විසඳයි. | 07 |

| නිපුණතාව | ksපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | **ඉගනුම් ඵල** | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | 9.2 ත්‍රිකෝණමිතික අනුපාත භාවිත කරයි. | • ආරෝහණ කෝණ, අවරෝහණ කෝණ<br>• ත්‍රිකෝණ මිතික අනුපාත භාවිතයෙන් ත්‍රිකෝණයක පාද සහ කෝණ සෙවීම<br>• $S=\frac{1}{2}ab\sin C$ සූත්‍රය භාවිතයෙන් ත්‍රිකෝණයක වර්ගඵලය සෙවීම. | • ප්‍රායෝගික අවස්ථාවලි දී අවරෝහණ කෝණ අවරෝහණ කෝණ ලැබෙන ආකාරය පිළිබඳ විමසිලිමත් වේ.<br>• සෘජුකෝණික ත්‍රිකෝණ ආශ්‍රිත දිග හා කෝණ සෙවීම සඳහා ත්‍රිකෝණමිතික අනුපාත භාවිත කරයි. (ප්‍රායෝගික අවස්ථාද ඇතුලත් ව)<br>• ත්‍රිකෝණයක සම්මත අංකනය භාවිතයෙන් ත්‍රිකෝණයක වර්ගඵලය සඳහා $S=\frac{1}{2}ab\sin C$ සූත්‍රය ලබා ගන්නා ආකාරය විස්තර කරයි.<br>• එම සූත්‍රය භාවිතයෙන් ත්‍රිකෝණයක වර්ගඵලය සොයයි. (ප්‍රායෝගික අවස්ථාද ඇතුලත් ව) | 06 |
| | 9.3 චාපයක දිග හා කේන්ද්‍රික ඛණ්ඩයක වර්ගඵලය සොයයි. | • චාපයක දිග<br>• කේන්ද්‍රික ඛණ්ඩයක වර්ගඵලය | • චාපයක දිග සෙවීම සඳහා $l=r\theta$ සූත්‍රය හඳුනා ගනියි.<br>• $l=r\theta$ සූත්‍රය භාවිතයෙන් චාපයක දිග ගණනය කරයි.<br>• කේන්ද්‍රික ඛණ්ඩයක වර්ගඵලය පහත සඳහන් සූත්‍ර ඇසුරින් ගණනය කරයි.<br>$S=\frac{1}{2}r^2\theta$ ($\theta$ රේඩියන් වලින් මැන ඇත).<br>$S=\frac{\theta}{2\pi}A$ ($\theta$ රේඩියන් වලින් මැන ඇත.<br>මෙහි A යනු කේන්ද්‍රික ඛණ්ඩය ලබාගත් මුල් වෘත්තයේ වර්ගඵලයයි.<br>$S=\frac{\alpha^0}{360^0}A$ $\alpha$ අංශක වලින් මැන ඇත.<br>$\alpha$ යනු අංශකවලින් මැන ඇති කේන්ද්‍රයේ ආපාතිත කෝණයයි.<br>• සංයුක්ත තල රූප ආශ්‍රිත ගැටලු විසඳීම සඳහා ඉහත සූත්‍ර භාවිත කරයි. | 08 |

| නිපුණතාව | ksපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | ඉගනුම් ඵල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 10.0 තාපය පිළිබඳ දැනුම එදිනෙදා කටයුතු සහ විද්‍යාත්මක කටයුතු සඳහා යොදා ගනියි. | 10.1 ඝන සහ ද්‍රව ප්‍රසාරණය පිළිබඳ අන්වේෂණය කරයි. | • තාපය<br>  • ප්‍රසාරණය<br>    • ඝන ද්‍රව්‍යවල රේඛීය, වර්ගඵල සහ පරිමා ප්‍රසාරණය<br>    • ද්‍රව ප්‍රසාරණය | • ඝන සහ ද්‍රව ප්‍රසාරණය, ප්‍රසාරණතාව සහ උෂ්ණත්ව වෙනස අතර සම්බන්ධතාව ඉදිරිපත් කරයි.<br>• තාපජ ප්‍රසාරණය භාවිත වන අවස්ථා විස්තර කර ගණනයන් සිදු කරයි. | 05 |
| | 10.2 තාප හුවමාරුව සහ අවස්ථා විපර්යාස පිළිබඳ අන්වේෂණයේ යෙදෙයි. | • තාප හුවමාරුව<br>• තාප ධාරිතාව<br>• විශිෂ්ඨ තාප ධාරිතාව | • තාප හුවමාරුවට අදාළ ගණනය කිරීම් සිදු කරයි.<br>• අවස්ථා විපර්යාසයක දී ලබා ගන්නා හෝ පිට කළ තාප ප්‍රමාණය ගණනය කරයි. | 05 |
